ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்பு சபை
**National Water Supply & Drainage Board**

සභාපති / தலைவர் / Chairman — Tel : 2634488, Fax : 2611234
උප සභාපති / உப தலைவர் / Vice Chairman — Tel : 2635883, Fax : 2610034
ප්‍රධාන කාර්යාලය / தலைமை அலுவலகம் / Head Office — Tel : 2638246, 2638256, 2638259, 2638260, 2621621
තැ.පෙ. / த.பெ.இல. / P.O. Box 14, ගල්කිස්ස / கல்கிஸ்சை / Mt. Lavinia

සාමාන්‍යාධිකාරී / பொது முகாமையாளர் / General Manager — Tel/Fax 2636449, E-mail gmnwsdb@gmail.com
Hunting No : 2638999
Fax : 2636449
E-mail : ch@waterboard.lk
ගාලු පාර / காலி வீதி / Galle Road, රත්මලාන / இரத்மலானை / Ratmalana, Sri Lanka


මගේ අංකය / எனது இல. / My No. COM/AGM/(R)/28

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date ............2025.02.13

ලේකම්
නාගරික සංවර්ධන ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය මගින් ,
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජෙනරාල්
ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
ඇසිදිසි මැදුර ,නාරාහේන්පිට
කොළඹ 05.

**<u>හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ගේ නිල නිවසේ ජල සැපයුම විසන්ධි කර ඇති බවට මාධ්‍යවල පල කර ඇති ප්‍රවෘත්තිය සම්බන්ධයෙනි</u>.**

හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ විජේරාම මාවතේ පිහිටි නිල නිවසෙහි ජල සැපයුම විසන්ධි කර ඇති බවට මාධ්‍ය මහින් ප්‍රචාරය කර ඇති පුවත සාවද්‍ය වේ . මෙම පුවත සම්බන්ධයෙන් පරීක්ෂා කිරිමේදී හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පදිංචිව සිටි නිල නිවස ආසන්නයේ ඇති වෙනත් ස්ථානයක හිඟ මුදල් නොගෙවීම නිසා අද දින ජල සැපයුම වින්ධිකර ඇත . නමුත් එම ස්ථානය හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පදිංචි නිල නිවස නොවේ.

මේ සම්බන්ධයෙන් අදාල ස්ථානයේහි දැනට සිටින හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ආරක්ෂක අංශයේ නිළධාරියෙකුගෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ) විසින් කල කරුණු විමසීමේදී එම ස්ථානයේ හිටපු ජනාධිපතිතුමාගේ ආරක්ෂක අංශයේ නිළධාරීන් නේවාසිකව සිටි බවත් ඔවුන් 2024 ඔක්තෝම්බර් මාසයේ එයින් ඉවත්ව ගොස් ඇති බවත් ප්‍රකාශ කර ඇත. එමෙන්ම එම ස්ථානයේ ජල සැපයුමෙන් හිටපු ජනාධිපතිතුමාගේ ආරක්ෂක නිළධාරීන් හෝ හිටපු ජනාධිපතිතුමා හෝ ජලය පරිහරණය නොකරන බවත් ප්‍රකාශ කරන ලදි. මීට පෙර මෙම ස්ථානයේ ජල ගාස්තු ගෙවීම් කර ඇත්තේ ජනාධිපති ලේකම් කාර්යාලයෙන් බව එම මහතා වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

අදාල ස්ථානයේ හිඟ මුදල් ගෙවීම් කරන ලෙස මෙම මණ්ඩලයේ නිළධාරීන් අවස්ථා කිහිපයකදීම ලිඛිතව සහ වාචිකව දැනුම් දී ඇති අතර අද දිනද මණ්ඩලයේ නිළධාරීන් එම ස්ථානයට ගොස් හිඟ මුදල් ගෙවීම් කරන ලෙස දැනුම් දී ඇත. හිඟ මුදල් නොගෙවීම නිසා අදාල ස්ථානයේ ජල සැපයුම විසන්ධිකරන ලද අතර මේ වන විටඅය විය යුතු හිඟ මුදල රු.429,000ක් පමණ වේ.

ඒ අනුව මෙම ස්ථානයේ ජල සැපයුම විසන්ධි කිරීම නිසා හිටපු ජනාධිපතිතුමාට හෝ ඔහුගේ ආරක්ෂක නිළධාරීන්ට කිසිදු බාධාවක් සිදුවී නොමැති බව අපගේ නිරීක්ෂණය වේ.

T.B 13/2/25

ඉංජිනේරු ටී බාරද්දාසන්
සාමාන්‍යාධිකාරී

පිටපත
1. සභාපති - ජා.ජ.ජ.ම - කා.දැ.ස



CamScanner